සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

**නම/විභාග අංකය :-- ..............................................................................** **කාලය : පැය 02 යි.**

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. බුදු රජාණන් වහන්සේ අවසාන වස් කාලය ගතකළේ,
   1. වේරංජා නුවර　　2. බේලුව නම් ගමේ
   3. මකුල පර්වතයේ　　4. පාරිලෙය්‍ය වනයේ

2. බුදු රජාණන් වහන්සේට අවසන් වරට දානය පිළිගැන්වූයේ,
   1. සුභද්ද පිරිවැජියා　　2. සුජාතා සිටු දුව
   3. උපක ආජීවකයා　　4. චුන්ද කර්මාර පුත්‍රයා

3. ''මා අධිකරණ විනිශ්චයේ දී පවා මිනිස්සු එකිනෙකා කතා කරති. මගේ කතාව අවසන් වන තුරු නොසිටිති. එහෙත් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන විට ශ්‍රාවකයන් වහන්සේලා කිවිසුම් හඬක් හෝ නොනගති. එය ආශ්චර්යයකි.'' යනුවෙන් කොසොල් රජතුමා ප්‍රකාශ කිරීමෙන් ප්‍රකට වන්නේ බුදුන් වහන්සේ තුළ පැවති,
   1. නිවැරදි දැක්මයි　　2. ආකර්ශණීය රූප විලාශයයි
   3. ආකර්ශණීය වාග් විලාශයයි　　4. අගතිගාමී නොවීමයි

4. මෙලොව පරලොව සැපත පිණිස පිළිගන්වනු ලබන සියලු දාන පිළිගැනීමට සුදුසු හෙයින් සංඝරත්නය,
   1. සුපටිපන්න නම් වේ　　2. උජුපටිපන්න නම් වේ
   3. ආහුනෙය්‍ය නම් වේ　　4. දක්ඛිණෙය්‍ය නම් වේ

5. බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවෙනි වසරේ වෙසක් පොහොය දින කැලණියට වැඩම කළේ කාගේ ආරාධනයෙන්ද?
   1. මණිඅක්ඛිත නා රජුගේ　　2. සුමන සමන් දෙවියන්ගේ
   3. චූලෝදර මහෝදර දෙදෙනාගේ　　4. දෙවනපෑතිස් රජුගේ

6. බුදු සසුනේ දීර්ඝ කාලීන අත්දැකීම් ඇති (චිරරාත්‍රඥ) භික්ෂූන් වහන්සේලා අතර අගතනතුර දැරුවේ,
   1. භද්දකච්චානා තෙරණියයි　　2. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි
   3. ඛේමා තෙරණියයි　　4. උප්පලවණ්ණා තෙරණියයි

7. වැස්සට තෙමී තෙමී සිටි බලු පැටවකු දුටු ළහිරු බලු පැටවා ගෙදරට ගෙනවිත් පිසදමා කෑම ටිකක් ද දුන්නේය. ඔහු තුළ පැවති ගුණාංගය වූයේ,
   1. මෙත්තා ය　　2. කරුණාව ය　　3. මුදිතාව ය　　4. උපේක්ඛා ය

8. සුමුදු නිරන්තරයෙන්ම අන් අයගේ දියුණුව දැක තමාගේ දියුණුව සේ සලකා සතුටු විය. ඔහු තුළ ඇත්තේ,

1. පරහිතකාමී බවය
2. මුදිතාවය
3. සහනශීලිතාවයයි
4. සහජීවනයයි

9. ''ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදානය හෙවත් සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය'' නමැති ග්‍රන්ථය රචනා කළේ,

1. බලංගොඩ ආනන්ද මෛත්‍රීය හිමි ය
2. වැත්තෑවේ හිමි ය
3. වැලිවිට සරණංකර හිමි ය
4. වීදාගම මෛත්‍රී හිමි ය

10. ලෝවැඩ සඟරාව රචනා කළේ,

1. වැලිවිට සරණංකර හිමි
2. වැත්තෑවේ හිමි
3. වීදාගම මෛත්‍රීය හිමි
4. බලංගොඩ ආනන්ද මෛත්‍රීය හිමි ය

11. චතු අප්පමඤ්ඤා ලෙස දැක්වෙන්නේ,

1. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
2. ඡන්ද, චිත්ත, විරිය, විමංසා
3. ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා
4. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය

12. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් අංග වනුයේ,

1. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා
2. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
3. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
4. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා සමාධි

13. ත්‍රිශික්ෂාවට අයත් නොවන්නේ,

1. සීල
2. සමාධි
3. ප්‍රඥා
4. වීර්යය

14. ''කිසිවෙක් මගේ ජීවිතයට හානි කරනවාට මම අකමැති බැවින් මම ද කිසිවෙකුගේ ජීවිතයකට හානියක් නොකරමි.'' යි ධම්මික පැවසුවේය. ඔහු තුළ ඇති ගුණාංගය වූයේ,

1. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලයයි
2. අත්තූපනායික ධර්ම පරියායයි
3. ලෝක පාලක ධර්මයයි
4. අවිහිංසාවාදී ප්‍රතිපත්තියයි

15. සතුන් මැරීම, හොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම යනාදි කයින් කරන අකුසල්වලින් ඈත්ව යහපත් ක්‍රියාවල නිරතවීම හඳුන්වන්නේ,

1. සම්මා සංකප්ප නමිනි
2. සම්මා දිට්ඨි නමිනි
3. සම්මා කම්මන්ත නමිනි
4. සම්මා සති නමිනි

16. සතර සතිපට්ඨානයට අයත් නොවන්නේ,

1. කායානුපස්සනා
2. වේදනානුපස්සනා
3. ධම්මානුපස්සනා
4. සංඥානුපස්සනා

17. සියල්ල පෙර කරන ලද කර්මයට අනුව සිදුවේ යන පුබ්බෙකත හේතුවාදය ඉදිරිපත් කළ ශාස්තෘවරයා වන්නේ,

1. ජෛන මහාවීර තුමා
2. සංජය බෙල්ලට්ඨිපුත්ත
3. පකුධ කච්චායන
4. මක්ඛලී ගෝසාල

18. බුදු සසුනේ ඍද්ධිමත් භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර දැරුවේ,

1. සැරියුත් හිමි　　2. මුගලන් හිමි
3. මහාකාශ්‍යප හිමි　　4. අනුරුද්ධ හිමි

19. අධිෂ්ඨාන පූර්වකව කටයුතු කිරීම, වඩාත් සාමකාමී පිළිවෙතකින් ඉල්ලීම් දිනා ගැනීමට කටයුතු කිරීම අනතිමානී ගුණයෙන් යුතුවීම, නිරහංකාර බව යන ආදර්ශ අපට ලබාගත හැකි චරිතයක් වන්නේ,

1. ඛේමා තෙරණියගේ චරිතය　　2. උප්පලවන්නා තෙරණියගේ චරිතය
3. භද්දකච්චායන තෙරණියගේ චරිතය　　4. ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතය

20. සර්වඥ ධාතු වැඩි ප්‍රමාණයක් නිදන් කොට ඇති ස්තූපය වන්නේ,

1. මිරිසවැටියයි　　2. රුවන්මැලි සෑයයි
3. අභයගිරියයි　　4. ථූපාරාමයයි

( ලකුණු 2 x 20 = 40 )

---

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. බුදු රජාණන් වහන්සේගේ යථාවාදී තථාකාරී ගුණය යනු කුමක්ද?
ii. සිදුහත් කුමරු වප් මඟුල් දින වඩන ලද භාවනාව කුමක්ද?
iii. බුදු රජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන්කොට සාදා ඇති ස්තූපය නම් කරන්න.
iv. බුදු සසුනේ සිව්වනක් පිරිස නම් කරන්න.
v. අටලෝ දහම නම් කරන්න.
vi. නිර්වාණය යනු කුමක්ද?
vii. බුදු දහමෙහි සඳහන් සන්තුස්සකෝ, සුභරෝ යන වචන දෙකෙහි අදහස ලියන්න.
viii. සිගාලෝවාද සූත්‍රයට අනුව ගිහියන් විසින් පැවිදි පක්ෂයට ඉටුකළයුතු යුතුකම් වලින් දෙකක් ලියන්න.
ix. අන්තිම බුද්ධ වචනය ලියන්න.
x. අනුරපුර අටමස්ථාන වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

2. i. බුදු රජාණන් වහන්සේ ජීවමාන කාලයේ බුදු සසුනේ පැවිදිව රහත් වූ අන්තිම ශ්‍රාවකයා කවුද? (ල. 02)
ii. සැදැහැතියන් විසින් දැක සංවේගය පහළ කළ යුතු ස්ථාන හතරක් බුදු රජාණන් වහන්සේ දක්වා ඇත. ඉන් තුනක් නම් කරන්න. (ල. 03)
iii. සම්බුද්ධ පරිනිර්වාණ සමයේ සිදුවීම් තුළින් ඔබට ගතහැකි ආදර්ශ ගෙනහැර දක්වන්න. (ල. 05)

3. i. බුදු රජාණන් වහන්සේගේ රූ සපුව දෙස බලා සිටීමේ ආශාවෙන් බුදු සසුනේ පැවිදි වූයේ කවුද?(ල. 02)
ii. බුදු සිරිතේ දක්නට ලැබෙන නායකත්ව ලක්ෂණවලින් තුනක් නම් කරන්න. (ල. 03)
iii. ඔබට නායකත්වය නිවැරදි ලෙස මෙහෙයවීමට බුදු සිරිතේ ශ්‍රේෂ්ඨ නායකත්ව ලක්ෂණ ආදර්ශයට ගතහැකි අයුරු විස්තර කරන්න. (ල. 05)

4. i. අත්තනාව කතං පාපං ..... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 02)

ii. එහි තේරුම ලියන්න. (ල. 03)

iii. ඔබ විසින් පාසලේ දී කරනු ලැබූ යහපත් ක්‍රියා 5 ක් විස්තර කරන්න. (ල. 05)

5. i. ආනාපානසති භාවනාව යනු කුමක්ද? (ල. 02)

ii. එම භාවනාව වැඩීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)

iii. ඔබ ආනාපානසති භාවනාව වඩන අයුරු පැහැදිලි කරන්න. (ල. 05)

6. i. සීලය යනු කුමක්ද? (ල. 02)

ii. සීලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධිය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 03)

iii. හිරි ඔතප් දෙකින් යුතුව ජීවත් වීමේ වැදගත්කම පහදන්න. (ල. 05)

7. පහත මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න. (එක් කොටසට ලකුණු 5 කි)

i. සම්මා ආජීවය.

ii. භද්දකච්චානා තෙරණිය.

iii. චාරිත්‍ර සීලය.

iv. චතුරාර්ය සත්‍යය.

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (4) | 03. (3) | 04. (4) | 05. (1) | 06. (2) | 07. (2) | 08. (2) | 09. (1) | 10. (3) |
| 11. (1) | 12. (2) | 13. (4) | 14. (2) | 15. (3) | 16. (4) | 17. (1) | 18. (2) | 19. (4) | 20. (1) |

### II පත්‍රය

01.i. කියන දේ කරන
ii. ආනාපාන සති භාවනාව
iii. ථූපාරාමය
iv. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා
v. ලාභ - අලාභ, යස - අයස, නින්දා - ප්‍රශංසා, සැප - දුක
vi. සියලු සංස්කාරයන් සංසිඳීම / සියලු බැඳීම් අත්හැරීම
vii. සන්තුස්සකෝ - ලද දෙයින් සතුටු වීම සුභරෝ - පෝෂණය කිරීම පහසු බව
viii. මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම, මෛත්‍රීසහගතව කතා කිරීම මෛත්‍රියෙන් සිතීම ශාසනික අවශ්‍යතා සඳහා තම නිවසට වැඩම කිරීමට ඉඩ සැලසීම, සිව්පසයෙන් උපස්ථාන කිරීම (මින් දෙකක්)
ix. මහණෙනි කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්ම නැසෙනසුලුය. නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම රැස් කරන්න.
x. රුවන්වැලි මහ සෑය, ශ්‍රී මහා බෝධිය, ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය, ලංකාරාමය, ලෝවාමහපාය

02. i. සුභද්‍ර භික්ෂුව
ii. බෝසතාණන් වහන්සේ ඉපදුන තැන - (ලුම්බිනිය)
බෝසතාණන් වහන්සේ බුදු වුන තැන - (බුද්ධගයාව)
බුදුන් වහන්සේ දම්සක් පැවැත්වූ තැන - (ඉසිපතනාරාමය)
බුදුන් වහන්සේ පිරිනිවන් පෑ තැන - (කුසිනාරානුවර) (මින් දෙකක්)
iii. සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න.

03. i. වක්කලී හාමුදුරුවෝ
ii. ආදර්ශවත් බව, නිවැරදි තීරණ ගැනීම, සමානාත්මතාව, යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී බව, ආකර්ශණීය වාග් විලාසය, ස්ථානෝචිත ප්‍රඥාව, බහුශ්‍රැත බව.
iii. ඉහත නායකත්ව ලක්ෂණ ඇසුරු කරගෙන ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න.

04. i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ
ii. තමා විසින්ම කරන පාපය තමා කිළිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව පවතින්නේ තම තමා අත ය. කෙනෙක් තවත් කෙනකු පිරිසිදු නොකරයි.
iii. සුදුසු පිළිතුරකට ලකුණු දෙන්න

05. i. හුස්ම ගැනීම සහ පිට කිරීම පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම ආනාපාන සති භාවනාවයි.
ii. ධාරණ ශක්තිය ලැබීම හේතුවෙන් උගත් කරුණු මතක තබා ගත හැකිවීම
තැන්පත් මනස තුළින් සාර්ථකත්වයට පත් වීමට හැකි වීම
මෙලොව සැනසීම ලැබීම
ලෙඩ රෝග සමනය වීම
පරලොව සැනසීම ලැබීම (මින් දෙකක්.)

**Answer**

iii. පළමුව පිරිසිදු වීම, පූජා ද්‍රව්‍ය පිළියෙල කොට තබා තෙරුවන් වැඳීම, සිල් සමාදන්වීම, භාවනාවට එළඹීම, පිරිමි බද්ධ පර්යංකයෙන්ද (කාන්තාවන් අර්ධ පර්යංකයෙන් ද හිඳගැනීම වඩාත් සුදුසුය) දැස් පියාගෙන දොහොත් මුදුන් දී තෙවරක් නමස්කාරය කීම, තිසරණ සහිත පන්සිල් සමාදන්වීම
ආශ්වාස ප්‍රශ්වාස කෙරේ අවධානයෙන් භාවනාවේ යෙදීම
අවසානයේ මාගේ භාවනාමය කුසලය ... යන පාඨය කියා ප්‍රාර්ථනා කිරීම

06. i. කය, වචනය සංවර කර ගැනීම
ii. පව්කම් නොකිරීම, පව් නොකරවීම, අන් අය පව් කරන විට අනුමත නොකිරීම
iii. පව් කිරීමට ලජ්ජාව හා භය ඇතිව කටයුතු කිරීම හේතුවෙන් වැරදිවලින් තොරව ජීවත්විය හැකි අයුරු දක්වා පිළිතුරු ලියා තිබීම අවශ්‍යයි.

07. i. සම්මා ආජීව යනු නිවැරදි දිවි පැවැත්මයි. ජීවත් වීම සඳහා යහපත් රැකියාවල යෙදිය යුතුය. කුහකකම්, කපටිකම් නොකළ යුතුය. අවි ආයුධ වෙළඳාම සත්ත්ව වෙළඳාම ආදී අධාර්මික වෙළඳාම්වලින් වැළකී සියලුම පාපී ක්‍රියාවලින් වැළකී ජීවත් වීමෙන් තමන්ටද ගරුත්වයක් හිමි වේ. සමාජයේ අන් අය සමග සතුටින් සමාදානයෙන් ජීවත් විය හැකි වේ. නිවැරදි දිවි පැවැත්මකින් ඇති විට සමාජයේ සියලුම දෙනා තමා හා සුහදශීලීව කටයුතු කළ හැකි වේ. (උචිත පිළිතුරකට ලකුණු දෙන්න) (පෙළපොතේ 15 පාඩම 92 පිටුව)

භද්දකච්චානා තෙරණිය

භද්දකච්චානා නමින් හඳුන්වන්නේ යසෝදරා දේවියයි. බිම්බා දේවිය නමින් ද රාහුල මාතා නමින් ද ප්‍රසිද්ධය. මෙතුමියගේ මව අමිතා බිසව වූ අතර පියා සුප්‍රබුද්ධ රජුය. සිදුහත් කුමරු උපන් දිනයේම උපත ලබා ඇත. සෙනෙහෙබර බිරිඳක ලෙසද වාසනාවන්ත මවක් ලෙසද කටයුතු කළාය. බුදුන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කළ අවස්ථාවේ නරසීහ ගාථා කියමින් රාහුල කුමරාට පියා පිළිබඳ හඳුන්වා දුනි. ඇය පෙර භවයෙත් පති භක්තියෙන් කටයුතු කර ඇති බව දක්වීමට බුදුන් වහන්සේ චන්දකින්නර ජාතකය දේශනා කර ඇත. භද්දකච්චායනා තෙරණිය අභිඥාලාභී භික්ෂුණීන් අතර අගතනතුරට පැමිණියාය. වයස අවුරුදු හැත්තෑ අටේදී පිරිනිවන් පෑසේක. පති භක්තියෙන් කටයුතු කිරීම, නිරහංකාර බව, විශිෂ්ට ඥානයෙන් යුතු වීම, නිකැලැල් චරිතයකින් යුතු වීම ආදී ආදර්ශ අපට ලබා ගත හැකිය.

(පෙළපොතේ 6 පාඩම 39-42 දක්වා පිටු)

චාරිත්‍ර සීලය

චාරිත්‍ර සීලය යනු සීලයේ මූලික ප්‍රභේදයකි. චාරිත්‍රය සමාදානය ලෙස ද දක්වේ. එනම් කළ යුත්ත කිරීමකි.
උදාඃ- ලෙස සතුන්ට කරුණාව දැක්වීම, අන් සතු දේ ආරක්ෂා කරීම, ශිෂ්ට සම්පන්න අඹු සැමි ජීවිතයක් ගත කිරීම, සත්‍ය වචන කතා කරීම ආදිය ගත හැකිය.

(පෙළ පොතේ 9 පාඩම 56 පිටුව)

චතුරාර්ය සත්‍යය

උතුම් ආර්ය සත්‍ය හතර යන අදහසින් චතුරාර්ය සත්‍යය නම් වේ. චතුරාර්ය සත්‍ය නම්
දුක්ඛ ආර්ය සත්‍යය (දුක පිළිබඳ උතුම් සත්‍යය)
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය (දුක ඇති වීමට හේතුව පිළිබඳ උතුම් සත්‍යය)
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (දුක නැති කිරීම පිළිබඳ උතුම් සත්‍යය)
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය (දුක නැති කිරීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යය)

පෙළ පොතේ 8 පාඩම 89 පිටුව)